ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA


මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date: 2026.07.02

පැමිණිලිකාර පාර්ශවය : එච්.බී.එන්.ඩබ්.අනුර කුමාර මයා,
නො. 19, පුවක්ගහතොටුපල පාර,
මොරටුමුල්ල,
මොරටුව.

වගඋත්තරකාර පාර්ශවය : 01. ලේකම්,
කර්මාන්ත අමාත්‍යාංශය,
73/1, ගාලු පාර,
කොළඹ 03.

02. සභාපති,
ලංකා මිනිරල් සැන්ඩ්ස් ලිමිටඩ්,
අංක 341/21, සරණ මාවත,
රාජගිරිය.

03. සාමාන්‍යාධිකාරී,
ලංකා මිනිරල් සැන්ඩ්ස් ලිමිටඩ්,
අංක 341/21, සරණ මාවත,
රාජගිරිය.

පැමිණිලි අංකය : එච්.ආර්.සී/2771/22

පැමිණිල්ලෙන් දක්වා ඇති කරුණු :

පැමිණිලිකරු ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ ඉහත අංකය යටතේ ගොනු කර ඇති තම පැමිණිල්ලෙන් පහත සඳහන් කරුණු ඉදිරිපත් කර සිටී. පැමිණිලිකරු 1996.12.02 වන දින සිට වසරක කාලයක් තුල කලමණාකාරීත්වය අභ්‍යාසලාභී (පරිපාලන) තනතුරේ පුහුණුව සාර්ථක ලෙස නිම කිරීම සැලකිල්ලට ගෙන 1997 දෙසැම්බර් මස 02 වන දින සිට ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් හි පරිපාලන නිලධාරී විධායක vi ශ්‍රේණියේ තනතුරට පත් කිරීමට තීරණය කළ බව 1997.12.16 දිනැති අංක:




ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ 04. / இல. 14, ஆர். ஏ. த. மெல் மாவத்தை, கொழும்பு 04. / No. 14, R. A. De Mel Mawatha, Colombo 04.
දුරකථනය / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 / 82
සභාපති / தவிசாளர் / Chairman: 011 - 250 5451
ලේකම් / செயலாளர் / Secretary: 011 - 250 5521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 250 5541/74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
ඊමේල් / மின்னஞ்சல் / E-mail: sechrcsl@gmail.com
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

LMS/PA/1447 දරණ ලිපිය මඟින් 02 වන වගඋත්තරකරු විසින් දන්වා තිබෙන බව සඳහන් කර සිටී. ඒ අනුව එකී තනතුර පැමිණිලිකරු විසින් භාර ගත් බවට අත්සන් තබා පිළිගෙන තම රාජකාරී කටයුතු සිදුකරගෙන යන ලද බවද දක්වා ඇත. මෙම තනතුර සඳහා ඔහු තෝරාගනු ලබන්නේ 1996.08.30 දින සහ 1996.09.24 දින පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ දෙකක් මත බව පැමිණිලිකරු කියා සිටී.

1997.12.02 දින සිට 2000.12.02 දින දක්වා තුන් අවුරුදු පරිවාස කාලය සතුටුදායක ලෙස නිමකල බැවින් එකී තනතුරේ පැමිණිලිකරු ස්ථිර කළ බව 2001.01.18 දින තම අංක: LMS/PA/1447 දරණ ලිපිය මඟින් පිරිස් සහ පාලන කලමණාකරු දන්වා තිබූ බවද පැමිණිලිකරු තම ලිඛිත දේශන සමඟ එකී ලිපියේ පිටපතක් ඉදිරිපත් කර දක්වා තිබේ.

තවද 02 වන වගඋත්තරකරු විසින් 2009.06.10 දින තම අංක: LMS/PF/1447 දරණ ලිපිය මඟින් පැමිණිලිකරුට දන්වා ඇත්තේ අභ්‍යන්තර උසස් කිරීම් සළකා බැලීමට 2009 ජුනි මස පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව 2008.09.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පිරිස් හා පරිපාලන කලමණාකාර විධායක III ශ්‍රේණියට පැමිණිලිකරු උසස් කිරීමේ නිර්දේශය අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ බවය.

2013.11.12 දින තම අංක : LMS/ET/08 දරණ ලිපිය ඉදිරිපත් කරමින් වගඋත්තරකරුවන් දක්වා ඇත්තේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සහ පරිපාලන) තනතුරට පැමිණිලිකරු ද අයදුම්පතක් ඉදිරිපත් කර ඇති බැවින් ඊට අදාළ සම්මුඛ පරීක්ෂණය 2013.11.18 දින පැවැත්වීමට නියමිත බැවින් එයට ඉදිරිපත් වන ලෙසය.

ඉහත කී සම්මුඛ පරීක්ෂණයෙන් අනතුරුව මෙම තනතුරට තේරී පත්ව සිටි පැමිණිලිකරු එකී තනතුරේ වැඩ බැලීමේ කාලසීමාවකට පත්කිරීමෙන් අනතුරුව සමාගමේ සභාපතිගේ 2022.04.25 දිනැති අංක LMS/PF/1447 දරණ ලිපිය මඟින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පාලන) තනතුරේ ස්ථිර කල බව දක්වා තිබේ.

පැමිණිලිකරු තම ලිඛිත දේශන තුළින් වැඩිදුරටත් දක්වා ඇත්තේ තමා වගඋත්තරකාර ආයතනයේ සේවයට බැඳුණු මුල් කාලයේ සිටම නිරන්තරයෙන් දේශපාලන පළිගැනීම්වලට ලක් වූ බවය. ඒ අනුව අවස්ථා තුනකදී විවිධ හේතූන් මුල් කර ගනිමින් පවත්වන ලද මූලික පරීක්ෂණ/විනය පරීක්ෂණ අනුව සේවයෙන් ඉවත් කළ බවද පෙන්වා දී තිබේ. ඒ ආකාරයට සේවයෙන් පහ කළ අවස්ථා දෙකකදී කම්කරු විනිශ්චයාධිකාරියේ නඩු පැවරීමේ හේතුව මත එකී අධිකරණය ඉදිරියේ වගඋත්තරකරුවන් විසින් ඇති කර ගන්නා එකඟතාවයන් මත නැවත සේවයේ පිහිටුවන ලද බව ප්‍රකාශ කර තිබේ.

නැවත නැවත ද විවිධ දේශපාලන කටයුතු වල යෙදෙන නිලධාරීන්ගේ සහ වෘත්තීය සංගම් විසින් ගන්නා ලද විවිධ විරුද්ධවාදී ක්‍රියාකාරකම් හා පෙත්සම් මත නිතර නිතර තම රැකියාවේ අස්ථිර භාවයක් ඇතිවන ආකාරයට වගඋත්තරකරුවන් විසින් විමර්ශන කටයුතු හෝ කමිටු ඇති කරමින් සොයා බැලීම් සිදු කරන්නට වූ බව තම පැමිණිල්ලෙන් පෙන්වා දී තිබේ. මෙහිදී කර්මාන්ත අමාත්‍යාංශය මෙන්ම යම් යම් අවස්ථාවල පත්වූ ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් හි සභාපතිවරුන් සහ අධ්‍යක්ෂ මණ්ඩල ද එලෙස තමාගේ රැකියාවට එරෙහිව අනීතිකව කටයුතු සිදු කරන්නට වූ බව ප්‍රකාශ කර තිබේ.

එක් අවස්ථාවකදී සභාපති ලෙස පත්ව සිටි මුදිත විජේසිංහ මහතා සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත තමාට සිදුවූ අනීතික හා ද්වේශ සහගත බලපෑම් පිළිබඳ කරුණු දක්වා ඉදිරිපත් කර කරන ලද අභියාචනා සළකා බැලීමට 2020.07.17 දින වගඋත්තරකාර සමාගමේ අධ්‍යක්ෂවරයෙක් වන එම්.ජී.සුනිල් මහතා පත්

කරමින් දේශපාලන පලිගැනීමක් සිදුව තිබේද යන්න පරීක්ෂා කර බැලීමට නම් කර තිබූ බව පෙන්වා දී තිබේ. ඒ අනුව එකී අධ්‍යක්ෂ මහතා විසින් පැමිණිලිකරුගේ අභියාචනය පිළිබඳ සොයා බලා දක්වා ඇත්තේ එම මහතා ප්‍රමුඛ කමිටුව 2020.07.31 වන දින පළමු වරට රැස්වූ බව ද විවිධ ලිපි ලේඛන හා තොරතුරු ද කරුණු ද රැස් කර ගනිමින් සිදු කරන ලද කමිටුවේ නිරීක්ෂණ වාර්තාව ඉදිරිපත් කර තිබූ බව ද එකී වාර්තාවල සටහන් වී ඇති ආකාරයට පැමිණිලිකරුට එරෙහිව විනය පරීක්ෂණ පවත්වා ඇත්තේ ආයතනයේ ඉහළ නිලධාරීන්ගේ උපදෙස් මත බව ද ස්වාධීන විනය පරීක්ෂණ ලෙස සැලකිය නොහැකි බව ඊට අදාළ විනය වාර්තා කියවා බැලීමේදී ඕනෑම අයෙකුට වැටහී යන බවය. එමෙන්ම පක්ෂග්‍රාහීව පලිගැනීමේ චේතනාවෙන් සිදු කරන ලද විනය පරීක්ෂණයක් බව එකී කමිටුවේ සාමාජික එම්.ජී.සුනිල් මහතා විසින් වාර්තා කර ඇති බව පෙන්වා දී තිබේ. පසුව ඉහත කී කමිටුවේ අධ්‍යක්ෂ මණ්ඩල සමාලෝචන කමිටු වාර්තාව ඉදිරිපත් කරමින් සමාගමේ අධ්‍යක්ෂ, පී.බී.ඒ. සංජීව මහතා විසින් තම නිර්දේශයේ දක්වා ඇත්තේ මෙම පැමිණිලිකරුට එරෙහිව සිදු කරන ලද විනය පරීක්ෂණ දේශපාලනමය පළිගැනීමක් ලෙස තහවුරු වන බව ද බොහෝ නිගමන වලට එළඹ ඇත්තේ උපකල්පන හා සැකයන් මත බව ද යුක්තිය අපගමනය වීමක් සිදුවීමෙන් පැමිණිලිකරුට අගතියක් වී ඇති බැවින් පැමිණිලිකරු වහාම ක්‍රියාත්මක වන පරිදි ඔහු දැරූ ජ්‍යෙෂ්ඨ කලමණාකරු ධුරයට නැවත පත් කළයුතු බව ද අහිමිව ගිය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් - පාලන) ධුරයට පැමිණිල්ලේ ඉල්ලා ඇති සහන ලබාදියයුතු බවට යන්න ඊට අදාළ ලේඛනය ඉදිරිපත් කරමින් දක්වා තිබේ.

ඒ අනුව 2022.04.25 දින සිට බලපැවැත්වෙන පරිදි ආයතනයේ පත්වීම් බලධාරියා වන සභාපති විසින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පාලන) තනතුරේ සේවය ස්ථිර කර රාජකාරී කටයුතු සිදු කිරීමට ඉඩ සලසා දුන් බව පැමිණිල්ලෙන් දක්වා තිබේ.

මෙම පැමිණිල්ල ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ ගොනු කිරීමට ප්‍රධාන හේතුවක් වූ සිදුවීම වන්නේ මෙම සමාගමට අයත් පුල්මුඩේ යන්ත්‍රාගාරයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පාලන) ලෙස සේවය කරමින් සිටියදී ඇති වූ සිදුවීමක් බව පැමිණිලිකරු දක්වා සිටින අතර එකී සිදුවීම සිදු වන්නේ 2022.06.27 දිනදී බව දක්වා තිබේ. එනම්, නැවත ද තම රැකියාව අහිමි කිරීමේ චේතනාවෙන් කුමන්ත්‍රණකාරී ලෙස කරන ලද සැලසුමක් මත සිදුවූ සිදුවීමක් බව ද එම සිදුවීම වන්නේ පැමිණිලිකරු පුල්මුඩේ යන්ත්‍රාගාරයේ තම රාජකාරී කටයුතු සිදු කරමින් සිටින අවස්ථාවේ ආයතනයේ පිහිටි යන්ත්‍රාගාර භූමියේ පැවති සේවකයින්ගේ ගෙවතු වගාවක් අයාලේ යන ගවයන් විසින් හානි කරන බවට ලද පණිවිඩයක් මත ඒ ස්ථානයට යාමේදී තම වාහනය ගමන් කළ මාර්ගය ඉදිරියේ ආරක්ෂක කලමණාකරු ලෙස සේවය කළ අනුෂ්ක අලුවිහාරේ යන අය සහ තවත් කිහිප දෙනෙකු සිටි බැවින් තම වාහනය එම ස්ථානයේ නතර කළ පසු ඇති වූ බහින්බස් වීමක් හේතු වූ බවය. මෙහිදී ආරක්ෂක කලමණාකරු වෙතින් මෙම ස්ථානයේ සිටීමට හේතුව හා පැමිණිලිකරු වන තමාට එරෙහිව කරන්නා වූ විවිධ අසත්‍ය ප්‍රචාර පිළිබඳ විමසීමට යාමේදී ගැටුමක් ඇති වූ බව පෙන්වා දී තිබේ. එනම්, තම රාජකාරී වලට අඛණ්ඩව බාධා කළ ආයතයේ ආරක්ෂක කලමණාකරු විසින් නීති විරෝධී අරගල සංවිධානය කරන්නට වූ බැවින් ඒවා ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නා විට තමා ඊට එරෙහි වීම මත අමනාපයකින් පසුවූ බව ද එහි සිටි සේවකයින්ගෙන් “ ඇයි පාරේ ප්‍රශ්නයක් ද” යන්න විමසා සිටි විට ඔවුන් “ නැහැ සර් අපේ නිවාඩු ලබාදෙන්නේ නැහැ”යනුවෙන් ප්‍රකාශ කර ඇති බව ද හැමෝටම නිවාඩු ලබාදීමට කටයුතු කර ඇති බවත් ඒ ගැන ප්‍රශ්නයක් ඇතිකර ගතයුතු නැති බවත් පැමිණිලිකාර තමා ප්‍රකාශ කළ අතර ආරක්ෂක කලමණාකරු තමාට රවමින් සිටි බව දුටු බැවින් “ ඔයා මට විරුද්ධව අන්තර් ජාලයෙන් මඩ ගහන්නේ ඇයි” කියා විමසූ බව ද එවිට ඔහු “ මම මඩ ගහනවා මම උඹට බය නැහැ, මම උඹව මරණවා මම මිනීමරුවෙක් මගේ පරම්පරාවම මිනීමරුවෝ මං උඹව මරණවා” කියා බැණ වැදුණු බව ද ප්‍රකාශ කර තිබේ. පැමිණිලිකරු ඒ වනවිට ද තම කැබ් රථයේ වාඩි වී සිටි බැවින් ඔහු අසලට

පැමිණ වාහනයට අතින් පයින් පහරදී පැමිණිලිකරුගේ අතට ද පහරදුන් බව දක්වා තිබේ. එම අවස්ථාවේ එහි සිටි සිසිර කුමාර යන අය සහ සේනාරත්න යන අය වහා ඉදිරිපත්ව මෙම සිද්ධිය සමථයකට පත් කළ බව ද දක්වා ඇත. නමුත් එදිනම පැමිණිලිකරු පුල්මුඩේ පොලිස් ස්ථානයට මෙම සිදුවීම පැමිණිලි කළ බව ද පොලිසිය විසින් ලබාදුන් GHT පත්‍රය අනුව පුල්මුඩේ රෝහලේ ප්‍රතිකාර සඳහා ඇතුළත් වූ පසු වාට්ටුවට ඇතුළත් කර අවශ්‍ය ප්‍රතිකාර ලබාදී එදිනම රාත්‍රී 10.00ට පමණ රෝහලෙන් පිටව යාමට හැකි බව පැවසීම මත තම නිල නිවාසයට පැමිණි බව දක්වා තිබේ.

තව ද පසු දින යන්ත්‍රාගාරයේ රාජකාරී සඳහා වාර්තා කර ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් හි කොළඹ ප්‍රධාන කාර්යාලයේ සාමාන්‍යාධිකාරී වෙත 2022.06.28 දින ඉහත සිදුවීම පිළිබඳව පැමිණිලි කරන ලද බව ද ආරක්ෂක කලමණාකරු විසින් සිදු කරනු ලබන මෙවැනි ක්‍රියාකාරකම් හේතුවෙන් රාජකාරී කිරීමේ අපහසුතාවයක් ඇති බව දක්වා කඩිනමින් ක්‍රියාමාර්ගයක් ගැනීමට ප්‍රකාශ කළ පසු එදිනම එනම්, 2022.06.28 දින 03 වන වගඋත්තරකාර සාමාන්‍යාධිකාරී විසින් තම වැඩ තහනම් කළ බව ලිඛිතව දන්වා තිබීම මත නැවත ද තම රැකියාව අහිමි වූ බව පැමිණිල්ලෙන් දක්වා තිබේ.

ඒ අනුව තම පැමිණිල්ල විභාග කර මූලික අයිතිවාසිකම් කඩවූ බවට තීන්දුවක් සහ ඉල්ලා ඇති සහන ලබාදෙන ලෙසට පැමිණිල්ලෙන් දක්වා තිබේ.

වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :

පැමිණිලිකරුගේ පැමිණිල්ලට අදාළව 2022.10.31 දින තම අංක : LMSL/LE/HRC/NO 2771-22 යටතේ වැඩ බලන සාමාන්‍යාධිකාරී විසින් අදාළ වාර්තාව ලබාදී තිබේ. ඉන් දක්වා ඇත්තේ පැමිණිලිකරු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, (පාලන හා මානව සම්පත්) ලෙස පුල්මුඩේ යන්ත්‍රාගාරයේ සේවය කරමින් සිටියදී ආරක්ෂක කලමණාකරු සමඟ ඇති කර ගත් ගැටුමක් හේතුවෙන් 2022.06.28 දින සිට වැඩ තහනම් කළ බව ද මූලික පරීක්ෂණයකට යටත්ව වැඩ තහනම් කර ඇති බැවින් එහි කටයුතු අවසන් වූ පසු ඉදිරි පියවර ගන්නා බවය. එමෙන්ම කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්ගේ උපදෙස් පරිදි මෙම සිද්ධිය සම්බන්ධව මූලික විමර්ශනය සිදු කිරීමට එකී අමාත්‍යාංශය යටතේ පවතින මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ අතිරේක ලේකම්වරයෙකු වන කැලුම් විජේනායක මහතා පත් කර ඇති බව ද දක්වා තිබේ.

2023.02.13 දින ද 03 වන වගඋත්තරකරු විසින් වැඩිදුර වාර්තාවක් ලබාදී ඇති අතර ඉන් දක්වා ඇත්තේ පැමිණිලිකරුගේ පත්වීම් සම්බන්ධව සහ විනය පරීක්ෂණ වලට අදාළව ඇති කරුණු වේ. පැමිණිලිකරු 1996 වසරේ සිට සේවයට පත් වූ ආකාරය සම්බන්ධව ද පවත්වන ලද විනය පරීක්ෂණ සම්බන්ධව ද ඊට අදාළ ඇමුණුම් සහිතව එකී වාර්තාව ඉදිරිපත් කර තිබිණ.

තව ද 2023.07.11 දින ද දෙවන වගඋත්තරකාර සමාගමේ සභාපති වන වෛද්‍ය උදේනි දසනායක යන අය විසින් තම අංක : LMSL/LE/HRC/NO 2771-22 යටතේ වාර්තාවක් ඉදිරිපත් කරමින් දක්වා ඇත්තේ පැමිණිලිකරු සේවයෙන් පහ කර ඇති බවය.

එමෙන්ම 2023.04.25 දින තම අංක : LMSL/LE/HRC/NO 2771-22 යටතේ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් ලෙස කටයුතු කරමින් නීති නිලධාරිනිය වන දමයන්ති කුරේ යන අය ද වාර්තාවක් ඉදිරිපත් කර ඇත. එහි ඇත්තේ මින් පෙර සේවය අවසන් කළ අවස්ථාවකදී පැමිණිලිකරු කම්කරු විනිශ්චයාධිකාරිය වෙත

ඉදිරිපත්ව නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලද බවද ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගන්නා ලද විවිධ තීරණ සහ ක්‍රියාමාර්ග පිළිබඳ වේ.

වැඩ බලන සාමාන්‍යාධිකාරී, එච්.එම්.ජේ.එම්.හේරත් මහතා විසින් 2023.03.10 දින තම අංක : LMSL/LE/HRC/NO 2771-22 යටතේ වැඩිදුරටත් දක්වා ඇත්තේ පැමිණිලිකරු තම පැමිණිල්ල ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ ගොනු කර ඇත්තේ 2022.06.27 දින ආරක්ෂක කලමණාකරු සමඟ ඇති වූ සිදුවීම මුල් කර ගනිමින් බව ද එහෙත් පැමිණිලිකරුගේ පත්වීමේ නිත්‍යානුකූල භාවය පිළිබඳව කර්මාන්ත අමාත්‍යාංශයෙන් මෙහෙයවීමෙන් සිදු කළ විමර්ශනයක තීරණය අනුව 2022.12.12 දිනසිට සේවයෙන් ඉවත් කළ බවද වේ.

පරීක්ෂණයේදී අනාවරණය වූ කරුණු :

මෙම පැමිණිල්ලට අදාළ පරීක්ෂණ කටයුතු වලදී දෙපාර්ශවය විසින් ඉදිරිපත් කරන ලද කරුණු පහත පරිදි වේ.

2022.11.25 දින පරීක්ෂණ අවස්ථාවේදී පැමිණිලිකරු පමණක් ඉදිරිපත්ව සිටින ලද අතර වගඋත්තරකරුවන් ඉදිරිපත්ව සිටියේ නැත. පැමිණිලිකරු කියා සිටින ලද්දේ, වගඋත්තරකාර සමාගමේ පුල්මුඩේ යන්ත්‍රාගාරයේ තමා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, (පරිපාලන හා මානව සම්පත්) ලෙස සේවය කරමින් සිටියදී 2022.06.27 දින එහි සේවය කළ ආරක්ෂක කලමණාකාර, අනුෂ්ක අලුවිහාරේ යන අය තමාට පහරදී තර්ජනය කිරීම සම්බන්ධව පැමිණිල්ලෙන් සවිස්තරාත්මකව කරුණු දක්වා ඇති බව ද මෙම සිදුවීම ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් හි සභාපති වෙත සිද්ධිය සිදුවූ දිනට පසු දින එනම්, 2022.06.28 දින ලිඛිතව දන්වා සිටි පසු එදින සිට තම වැඩ තහනම් කළ බව ය. එමෙන්ම ආරක්ෂක කලමණාකරුගේ ද වැඩ තහනම් කළ බව ද පසුව මූලික පරීක්ෂණයක් සිදු කිරීමෙන් අනතුරුව ආරක්ෂක කලමණාකරු සේවයේ පිහිටුවා තමා සේවයේ පිහිටුවීම සිදු නොකළ බව කියා සිටින ලදී. එමෙන්ම ඒ වනවිට ආයතනයේ පැවති සාමාන්‍යාධිකාරී තනතුර ඇබෑර්තු වී තිබීම මත ඊට තමාද අයදුම්පතක් ඉදිරිපත් කරමින් සම්මුඛ පරීක්ෂණ සඳහා ඉදිරිපත් වීමට බලාපෙරොත්තුව සිටියදී වගඋත්තරකරුවන් විසින් එයට පැමිණිලිකාර තමාගේ ඉදිරිපත්වීම වළක්වාලීම සඳහා කටයුතු කරමින් සිටින බව දක්වා තමාටද ඊට ඉදිරිපත් වීමට අවස්ථාව ඉල්ලා සිටින ලදී. මෙදින පරීක්ෂණයට වගඋත්තරකරුවන් ඉදිරිපත්ව නොසිටි අතර ඉදිරිපත් නොවීමට හේතු එම අවස්ථාවේ වාර්තා කර නොතිබූ අතර 2022.12.01 දින නීති නිලධාරිනී, දමයන්ති කුරේ යන විසින් මෙම පරීක්ෂණයට ඉදිරිපත් නොවීමට හේතු දක්වා වෙනත් දිනයක් ඉල්ලා ලිඛිත දැන්වීමක් සිදු කර තිබුණ.

2023.01.24 දින දෙවන පරීක්ෂණ දින පැමිණිලිකරු ද වගඋත්තරකරුවන් වෙනුවෙන් වැඩ බලන සාමාන්‍යාධිකාරී, එච්.එම්.ජේ.එම්.හේරත් මහතා ද නීති නිලධාරී, දමයන්ති කුරේ මිය සහ පරිපාලන නිලධාරී, එල්.එම්.රාමනායක මහතා ද ඉදිරිපත්ව සිටින ලදී.

පැමිණිලිකරු තම පැමිණිල්ල පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීමෙන් අනතුරුව වැඩිදුරටත් කියා සිටින ලද්දේ, 2022.06.27 වන දින ඇති වූ ගැටුම ඇති කළ ආරක්ෂක කලමණාකරු වන අනුෂ්ක අලුවිහාරේ යන අය මූලික පරීක්ෂණයකින් අනතුරුව සේවයේ පිහිටුවා ඇති බව ද පැමිණිලිකාර තමා සේවයේ පිහිටු වීමට නියම කර තිබුණ ද සේවයේ පිහිටුවීමක් සිදු කර නොමැති බවය. වගඋත්තරකරුවන් දක්වා සිටින ලද්දේ, 2022.06.27 දින ගැටුමට අදාළව පවත්වන ලද මූලික පරීක්ෂණයෙන් පසු වැඩ තහනම් කළ

ආරක්ෂක කලමණාකරු සහ මෙම පැමිණිලිකරු නැවත සේවයේ පිහිටුවීමට දන්වා තිබුණද ආරක්ෂක කලමණාකරු පමණක් සේවයේ පිහිටුවා පැමිණිලිකරු සේවයේ පිහිටුවා නැත්තේ පැමිණිලිකරුගේ පත්වීම් වල නිත්‍යානුකූල භාවය සම්බන්ධව සොයා බැලීමට කමිටුවක් පත් කර තිබූ බැවින් බව ද එකී කමිටුවේ තීරණය ලද පසුව සේවයෙන් පහ කළ බවය. එහෙත් පැමිණිලිකරු මෙම අවස්ථාවේ කියා සිටින ලද්දේ එවැනි කමිටුවක් පිළිබඳව තමා කිසිදු දිනක අසා නොමැති බව ද කිසිදු අවස්ථාවක එවැනි කමිටුවක් ඉදිරියට තමා කැඳවා නොමැති බව ද තමාගෙන් නිදහසට කරුණු විමසීමකින් තොරව තම රැකියාව සම්බන්ධව තීරණ ගනිමින් සේවයෙන් පහ කර ඇත්තේ කුමන හේතුවක් මත ද යන්න දැන ගැනීමට අවශ්‍ය බවය. එසේම තමාට එරෙහිව ඇති චෝදනාව පිළිබඳව පැහැදිලි කර දී ඊට අදාළව කරුණු විමසීමක් සිදු නොකර ඒකපාර්ශ්විකව කමිටුවක් විසින් තීරණය කර තම රැකියාව අහිමි කර ඇත්තේ කෙසේද යන්න ප්‍රශ්න කර සිටින ලදි. එහෙත් ඒ පිළිබඳව වගඋත්තරකරුවන් කියා සිටින ලද්දේ කමිටුව විසින් ගන්නා ලද තීරණ පැමිණිලිකරුට ලිඛිතව දන්වා ඇතත් එකී ලිපිය පැමිණිලිකරු අතට පත් නොවී ආයතනයට නැවත ලැබී ඇති බවය. පැමිණිලිකරු කැඳවීමකින් තොරව හෝ ඔහුට සවන්දීමකින් බැහැරව කමිටුවක් විසින් එවැනි තීරණයක් ගන්නා ලද්දේ කෙසේද යන්න විමසා සිටියද ඊට අදාළ තීරණය කමිටුව විසින් ගන්නා ලද බව දෙවන සහ තෙවන වගඋත්තරකරුවන් විසින් ප්‍රකාශ කරන ලදි.

තවද 2023.04.25 දින පරීක්ෂණ අවස්ථාවේදී දෙපාර්ශවය විසින් වාචික කරුණු සැලකර සිටීමෙන් අනතුරුව තවදුරටත් ලිඛිත දේශන මගින් කරුණු ලබාදීමට කටයුතු කරන බව පෙන්වා දෙන ලදි. එමෙන්ම තමාට කරුණු දැක්වීමට අවස්ථාවක් නොදී කිසිදු සවන්දීමකින් තොරව ගන්නා ලද ඒකපාර්ශවීය කමිටු තීරණ අනුව තමාට බරපතල අසාධාරණයක් සිදුව ඇති බව ද පාර්ශවයන්ට සවන් දියයුතු බවට ඇති නීතිමය සිද්ධාන්ත පවා උල්ලංඝනය කරමින් වගඋත්තරකරුවන් කටයුතු කර ඇති බවද පැමිණිලිකරු පෙන්වා දෙන ලදි.

නිරීක්ෂණ සහ නිගමන :

පැමිණිලිකරු තම පැමිණිල්ල ගොනු කළ දින සිට පරීක්ෂණ කටයුතු අවසන් කරන ලද දින දක්වා ගොනු කළ සියළු කරුණු හා ලේඛන සමඟ ඉදිරිපත් කළ ඇමුණුම් වෙත ද වගඋත්තරකරුවන් විසින් ඉදිරිපත් කරන ලද සියළු ලේඛන හා ඊට අදාළ ඇමුණුම් වෙත ද කොමිෂන් සභාව විසින් කරන ලද ඉල්ලීම් අනුව ඉදිරිපත් කළ කමිටු වාර්තා හා විමර්ශන වාර්තා වෙත ද අවධානය යොමු කරමින් සිදු කරන ලද නිරීක්ෂණ අනුව එළඹෙන ලද නිගමන පහත පරිදි වේ.

පැමිණිලිකරු වගඋත්තරකාර සමාගමේ සේවයට බැඳී ඇත්තේ පහත සඳහන් ආකාරයට බව ඉදිරිපත්ව ඇති ලේඛන හා කරුණු අනුව තහවුරු වේ. එනම්, පළමු පත්වීම වන්නේ ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් හි සභාපති විසින් 1997.12.16 දින තම අංක : LMS/PA/1447 යටතේ පැමිණිලිකරුට දන්වා එවා ඇති ආකාරයට අනුව පැවති සම්මුඛ පරීක්ෂණයකින් පසු කලමණාකාර අභ්‍යාසලාභී (පරිපාලන) තනතුරට පැමිණිලිකරු තෝරා ගත් බව ද ඒ අනුව පුල්මුඩේ පිහිටි යන්ත්‍රාගාරයේ සේවයට අනුයුක්ත කළ බව ද එම තනතුර වසර 03ක පරිවාස කාලයකට යටත් බවද යන්නය. 1997.12.02 දින පැමිණිලිකරු සේවයට වාර්තා කර ඇති අතර 2000.12.02 දින වනවිට සතුටුදායක ලෙස පරිවාස කාලය සම්පූර්ණ කිරීම මත පරිපාලන නිලධාරී විධායක vi ශ්‍රේණියට පත් කර තනතුර ස්ථිර කරන ලද බව ද එය 1997.12.02 දින සිට බලපැවැත්වෙන බව ද සමාගමේ පිරිස් හා පාලන කලමණාකරු විසින් 2001.01.18 වන දින තම අංක :

LMS/PF/1447 දරණ ලිපිය මගින් දැනුම් දී ඇති බව නිරීක්ෂණය වේ. ඒ අනුව පැමිණිලිකරුගේ මුල් පත්වීම සහ ස්ථිර පත්වීම ප්‍රදානය කර තිබීම වගඋත්තරකාර සමාගම පරිපාලන හා විධායක තීරණ අනුව නීත්‍යානුකූල ලෙස ගෙන ඇති බව අනාවරණය වේ.

වගඋත්තරකාර සමාගමේ සභාපති විසින් 2009.06.10 දින තම අංක : LMS/PF/1447 තුළින් දක්වා ඇත්තේ අභ්‍යන්තර උසස්වීම් සඳහා සලකා බැලීමට 2009 ජූනි මස පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව පැමිණිලිකරු තේරී ඇති බව ද 2008.09.01 දින සිට බලපැවැත්වෙන පරිදි පැමිණිලිකරු පිරිස් හා පාලන කලමණාකාර III ශ්‍රේණියට පත් කළ බවය. මෙය වගඋත්තරකාර සමාගමේ පත්වීම් බලධාරියා වන සභාපති විසින් සුදුසුකම් සළකා බැලීමට සිදු කළ සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව කරන ලද පත් කිරීමක් බව පෙනී යයි. පසුකාලීනව මෙම සමාගමේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පරිපාලන හා මානව සම්පත්) තනතුර සඳහා ද සුදුස්සෙකු තෝරා ගැනීම සඳහා ප්‍රසිද්ධ පුවත්පත් මගින් අයදුම්පත් කැඳවා ඇති බව පැමිණිලිකරු තම ලිඛිත දේශනය සමඟ අමුණා ඉදිරිපත් කර ඇති ඊට අදාළ පුවත්පත් නිවේදන අනුව සනාථ වේ. පැමිණිලිකරු ද එයට අයදුම් කර තිබී ඇති අතර වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී විසින් 2013.01.12 දින තම අංක : LMS/ET/08 අනුව දක්වා ඇත්තේ ඊට අදාළ සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වන ලෙස ය. පැමිණිලිකරු එකී සම්මුඛ පරීක්ෂණයෙන් අනතුරුව තෝරා පත් කර ගන්නා ලද බව ද 2020.09.02 දින එවකට වගඋත්තරකාර සමාගමේ සභාපති ලෙස කටයුතු කළ මුදිත විජේසිංහ මහතා විසින් පැමිණිලිකරු එකී තනතුරේ වැඩ බැලීමට පත් කිරීම සිදු කළ බවද ඉදිරිපත් කර ඇති ලේඛන අනුව අනාවරණය වේ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන හා මානව සම්පත්) තනතුරේ වැඩ බැලීමට ලබාදෙන ලද එම පත්වීම කලින් කලට දීර්ඝ කරමින් තාවකාලිකව වැඩ බැලීමේ කාලය දීර්ඝ කර තිබී ඇති අතර 2020.08.30 දිනට අවසන් වීමට නියමිතව තිබූ එම කාලය 2020.08.31 දින පැවති වගඋත්තරකාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නැවත එම කාලය දීර්ඝ කිරීමට තීරණය කර තිබී ඇති බව අදාළ ලේඛන නිරීක්ෂණය කිරීමේදී අනාවරණය වේ. සමාගමේ පත්වීම් බලධාරියා වන සභාපති විසින් 2022.04.25 දින තම අංක : LMS/PF/1447 අනුව පැමිණිලිකරු එකී තනතුරේ ස්ථිර කිරීමට කටයුතු කළ බව ද ලේඛන අනුව නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු පුල්මුඩේ යන්ත්‍රාගාරයේ ඉහත තනතුරේ සේවය කරමින් සිටියදී 2022.06.27 දින සිදු වූ පැමිණිල්ලේ සඳහන් ගැටුම්කාරී සිදුවීමක් මත සේවය අවසන් කර වැඩ තහනම් කිරීමට කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ. ඒ අනුව එකී සිදුවීම 2022.06.27 දින සිදුවූ පසු 2022.06.28 දින පැමිණිලිකරුගේ වැඩ තහනම් කළ බව පැමිණිල්ලෙන් දක්වා තිබේ. මෙම වැඩ තහනමට හේතු වී ඇති විශේෂිත සිද්ධිය වන්නේ පැමිණිලිකරු හා පුල්මුඩේ යන්ත්‍රාගාරයේ සේවය කළ ආරක්ෂක කලමණාකාර, අනුෂ්ක අලුවිහාරේ යන අය සමඟ හට ගත් පුද්ගලික ආරවුලක් බව පෙනී යන අතර එම සිදුවීම වැඩ තහනම් කිරීමක් දක්වා පියවර ගැනීමට තරම් කටයුතු කළයුතු සිදුවීමක් ලෙස නිරීක්ෂණය නොවේ. 2022.06.28 දින එනම්, සිදුවීම සිදුවූ දිනට පසු දින පැමිණිලිකරු විසින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පිරිස් හා පාලන) ලෙස කටයුතු කරන තමා හට ආරක්ෂක කලමණාකරුගෙන් රාජකාරී කටයුතු කිරීමේදී සිදුවන බාධාකාරී තත්ත්වයන් පිළිබඳ ලිඛිතව වගඋත්තරකාර සමාගමේ සභාපති වෙත ලියා ඉදිරිපත් කර තමාට සිදු කළ පහරදීම හා තර්ජනය පිළිබඳව ද ඉන් දන්වා තිබේ. එකී ලිඛිත දැන්වීම ඉදිරිපත් කර පැමිණිලිකරු විසින් ඉන් ඉල්ලා ඇති සහනදායී පිළිතුර වෙනුවට එදිනම වැඩ තහනම් කිරීමට කටයුතු කර ඇත.

මෙම සිදුවීම සිදුවූ දිනම පුල්මුඩේ පොලිස් ස්ථානය වෙත පැමිණිලිකරු පැමිණිල්ලක් ගොනු කළ පසු පොලිසිය විසින් පැමිණිලිකරුට පහරදීමක් සිදු වූ බව කියා සිටි බැවින් රෝහල් ගත කිරීමට කටයුතු කර තිබී ඇති අතර අනතුරුව මූලික ප්‍රතිකාර ලබා ගත් පසු පැමිණිලිකරු එදිනම රාත්‍රී රෝහලෙන් පිටව යාමට

අවශ්‍ය පියවර ගෙන ඇති බව ද නිරීක්ෂණය වේ. පැමිණිලිකරු ඡායාරූපමය සාක්ෂි ඉදිරිපත් කරමින් රෝහල්ගතව ප්‍රතිකාර ගන්නා ආකාරය තහවුරු කර තිබේ.

පැමිණිලිකරු කියා සිටින්නේ, මෙම සියළු සිදුවීම් පසුපස ආයතනයේ සේවය කරන නිලධාරීන් සහ විවිධ වෘත්තීය සේවක සංගම් විසින් දරනු ලබන දේශපාලනික මතවාද ඇති බව ය. ඒ අනුව තමාට එරෙහිව කටයුතු කිරීමට හේතුවක් වී ඇත්තේ ද එකී සංගම් හා නිලධාරීන් විසින් දරන ලද දේශපාලනික මත වාදයන්ට පරිබාහිර වූ දේශපාලනික මත වාදයක් තමා දරන බැවින් බව ද පෙන්වා දී තිබේ.

පැමිණිලිකරු විසින් තම රැකියාව ලද දින සිට කෙටි කලක් තුළ වගඋත්තරකරුවන් විසින් කටයුතු කරන ලද ආකාරය අනුව තම රැකියාවට එරෙහිව දිගින් දිගටම සිදුවූ බලපෑම් පිළිබඳව පෙන්වා දී තිබේ. ඒ අනුව 2000-2001 වසර තුළදී හා 2015 වසරේ දී ඒක පුද්ගල පරීක්ෂණ සිදු කරමින් ද්වේශ සහගතව ක්‍රියා කර පැමිණිලිකරු සේවයෙන් ඉවත් කළ බව ද තම ලිඛිත දේශන තුළින් පැමිණිලිකරු ප්‍රකාශ කර තිබේ. තමා නිතර දේශපාලනමය හේතූන්මත පලිගැනීමට ලක් වන බව පෙන්වා දීමට පැමිණිලිකරු උත්සාහ දරන ලද අවස්ථාවක් ලෙස පෙන්වා දියහැකි ලේඛනයක් වන්නේ 2021.10.31 දින (ඇමුණුම 21) ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණේ එවකට සභාපති ලෙස කටයුතු කළ ජී.එල්.පීරිස් මහතා වෙත පැමිණිලිකරු විසින් ලිඛිතව කරුණු දක්වමින් කරන ලද ප්‍රකාශය ය. ඉන් දක්වා ඇත්තේ විවිධ නිලධාරීන් විසින් හා සේවක සංගම් විසින් දිගින් දිගටම තමාගෙන් දේශපාලනික වශයෙන් පලිගැනීම් සිදු කරන බව ද එකී පාර්ශවයන් නියෝජනය කරනු ලබන දේශපාලනික පක්ෂ රාජ්‍ය බලයට පත්වීමත් සමඟම පලිගැනීමේ සිදුවීම් වැඩි බලපෑමක් සහිතව තමාට එරෙහිව ක්‍රියා කරන බව ද තම රැකියාව අහිමි කිරීමට උත්සාහ දරමින් සිටින බවය. 1977 වසරේ සිට පැමිණිලිකරු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ක්‍රියාකාරීව කටයුතු කළ බව ද "අත" ලකුණ යටතේ පසුකාලීනව පළාත් පාලන මැතිවරණය සඳහා ඉදිරිපත්ව ජයග්‍රහණය කළ අයෙකු බව ද පෙන්වා දී තිබේ. එක් අවස්ථාවකදී පැමිණිලිකරුට සිදුවූ දේශපාලනික පළිගැනීම් සොයා බැලීමට පත් කළ කමිටුවක් විසින් දෙන ලද නිර්දේශය ප්‍රකාරව පැමිණිලිකරුට සිදුව තිබූ අසාධාරණමය ක්‍රියාකලාපයන් සමනය කිරීමක් ලෙස ආයතනයේ පත්වීම් බලධාරියා වන සභාපති විසින් නැවත ඔහුගේ නිත්‍ය තනතුර වන පිරිස් හා පරිපාලන කළමණාකරණ තනතුරේ පිහිටුවා පසුව වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ලෙස ද නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පාලන) තනතුරේද ස්ථිර කර ඇති බව ඊට අදාළ ලේඛන නිරීක්ෂණය කිරීමේදී නිරීක්ෂණය වේ.

ඒ අනුව 2022.06.28 දින ආයතනයේ ආරක්ෂක කළමණාකාර අනුෂ්ක අලුවිහාරේ යන අය විසින් ඇති කළ ගැටුම්කාරී සිදුවීමට අදාළ කරුණු ලිඛිතව ආයතන ප්‍රධානියා වෙත එකී සිදුවීම සිදුවූ පසු දිනම ලිඛිතව වාර්තා කර තිබියදී පසු දිනම පැමිණිලිකරුගේ වැඩ තහනම් කර ඇති අතර එම සිදුවීම අවස්ථාවේම සමථයකට පත්ව තිබුණද දෙදෙනාගේම වැඩ තහනම් කිරීම සිදු කර තිබීම ඒ සඳහා ගතයුතු වඩාත් සුදුසුම පියවර ලෙස තීරණය කරන ලද්දේ කුමන පදනමක් මත ද යන්න පැහැදිලි නොවේ. එකී සිදුවීම සම්බන්ධව මූලික පරීක්ෂණයක් සිදු කර අවසානයේ දෙදෙනාම නැවත සේවයේ පිහිටුවීමට තීරණය කළ ද ආරක්ෂක කළමණාකාර, අනුෂ්ක අලුවිහාරේ යන අය සේවයේ පිහිටුවා පැමිණිලිකරු සේවයේ පිහිටුවීම සිදු නොකිරීමට පියවර ගෙන තිබෙන අතර ඊට හේතුව වන්නේ වෙනත් කාරණාවක් බව පැමිණිලිකරු හඳුනා ගන්නා ලද්දේ මානව හිමිකම් කොමිෂන් සභාවේ පරීක්ෂණ අවස්ථාවේදී ය. ඒ අනුව එම අවස්ථාවේ පෙනී යන කාරණාවක් වන්නේ පැමිණිලිකරු පැමිණිල්ල ගොනු කර ඇත්තේ 2022.06.27 දින සිදුවූ ඉහත කී සිදුවීමට අදාළව වැඩ තහනම් කර තිබීම සම්බන්ධව වුවද පරීක්ෂණ අවස්ථාවේ වගඋත්තරකරුවන් ඉදිරිපත් කළ කාරණා අනුව පෙනී යන ලද්දේ පැමිණිලිකරු එතෙක් ලබා තිබූ පත්වීම් වල නීත්‍යානුකූල භාවය සොයා බැලීමට කමිටුවක් පත් කර ඉන් ලද තීරණය අනුව වැඩ තහනම් කර තිබෙන බව හඳුනා ගතහැකි වීමය. ඒ පිළිබඳ එම එලෙස වැඩ තහනම් කිරීමක්

සිදු කරන ලද්දේ කුමන හේතුන් මත ද යන්න විමසා සිටියද එය පැමිණිල්ලේ කොටසක් නොවන බැවින් ඒ පිළිබඳ විමසීම් සිදු කිරීම සම්බන්ධව වගඋත්තරකරුවන්ගේ අකමැත්තක් තිබූ බව වගඋත්තරකරුවන් විසින් ලබා දෙන ලද ඔවුන්ගේ කරුණු ඇතුළත් වාර්තා තුළ ඇති කරුණු අනුව පැහැදිලි වේ. එහෙත් පැමිණිලිකරුගේ චේතනාව වන්නේ නැවත රැකියාව ලබාගැනීම බැවින් ද පරීක්ෂණ අවස්ථාව වන විට ද ඔහු දැන සිටියේ වැඩ තහනම් කර ඇත්තේ 2022.06.27 දින සිදුවූ සිදුවීමට අදාළව පමණක් බැවින් වෙනත් සිදුවීමක් එම අවස්ථාවේ පැමිණිල්ලේ සඳහන් කිරීමට තරම් තමා නොදැන සිටි බවද නිරීක්ෂණය වේ. පැමිණිලිකරුගේ වැඩ තහනම් කරන ලද්දේ 2022.06.28 දින දී ය. එමෙන්ම පැමිණිලිකරුට නොදන්වා වගඋත්තරකරුවන් විසින් කමිටුවක් පත් කර ඒකපාර්ශ්විකව පැමිණිලිකරුගේ රැකියාව අවසන් කිරීමට තීරණය කර තිබීම පිළිබඳ පරීක්ෂණ අවස්ථාවේ පැමිණිලිකරු මවිතයකට පත් වන්නේ ඒ දක්වාම ඔහු ඒ පිළිබඳ නොදැන සිටි බැවින් බව නිරීක්ෂණය වේ. මෙම පරීක්ෂණ කමිටුව පත් කර ඇත්තේ 2022.06.28 දින දී ය. ඒ අනුව ඔහුගේ වැඩ තහනම් කළ දිනදීම එවැනි කමිටුවක් පත්කිරීමේ අවශ්‍යතාවයක් ඇති වූයේ කුමන පදනමක් මත ද යන්න සනාථ නොවුනද පැමිණිලිකරුගෙන් දිගින් දිගටම දේශපාලනික හේතුන් මත පලිගැනීම් සිදුව ඇති බවට පැමිණිලිකරු කියා සිටින කාරණාව ඉන් සනාථ වන බව නිරීක්ෂණය වේ. පැමිණිලිකරුගේ සේවා කාලය පුරාම විවිධ අවස්ථා වල පැමිණිලිකරුට එරෙහිව ගන්නා ලද විවිධ පරීක්ෂණ හා කමිටු තීරණ තුළින් ද අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අනුව ද සිදුව ඇත්තේ පැමිණිලිකරුගේ රැකියාව අස්ථිර කිරීමට අවශ්‍ය පියවර ගැනීම සිදුවීම බව නිරීක්ෂණය වේ.

පැමිණිලිකරුගේ තනතුරු වල නිත්‍යානුකූල භාවය සොයා බැලීමට පත් කළ කමිටුව පත් කර ඇත්තේ දෙපාර්ශවයට සවන්දියයුතුය යන මූලික නීතිමය සිද්ධාන්තය උල්ලංඝනය කරමින් බව පෙනී යයි. ඊට හේතුව වන්නේ එකී පරීක්ෂණ කමිටුවේ අවසන් නිර්දේශය ලබාදෙන මොහොත දක්වාම පැමිණිලිකරු කැඳවා නිදහසට කරුණු විමසීමක් කර නැති බැවිනි. එමෙන්ම යුක්තිය පසිඳලීම පමණක් නොව යුක්තිය පසිඳලීම සාධාරණව සහ යුක්ති සහගතව සිදුවන බව පෙනී යා යුතුය යන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පිළිබඳව වූ III වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව ද උල්ලංඝනය කර ඇති බව මින් නිරීක්ෂණය වේ. ඊට හේතුව වන්නේ මෙම පරීක්ෂණ කමිටුව කටයුතු කර ඇති ආකාරය හෝ විමසන ලද්දේ කුමන කාරණාවක් ද යන්න පැමිණිලිකරු ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ පැවති පරීක්ෂණ කටයුතු අවස්ථාව වනතුරු ද දැන නොසිටි බැවින් එමෙන්ම එකී 12(1) ව්‍යවස්ථාව ප්‍රකාරව නීතිය ඉදිරියේ දී සලකා බැලියයුතු කාරණාවක් වන සමානාත්මතාවයේ අයිතිවාසිකම ද උල්ලංඝනය වී තිබේ. එමෙන්ම මූලික අයිතිවාසිකම් යටතේ සුරක්ෂිත කර ඇති නීත්‍යානුකූල වූ රැකියාවක නියැලීමේ අයිතිවාසිකමට ද එරෙහිව කටයුතු සිදු කර තිබෙන බව පෙනී යන අතර මෙම සිදුවීම කොතෙක් දුරට පැමිණිලිකරුට බලපෑමක් සිදුකර තිබේද යන්න පිළිබඳ වැටහෙන්නේ පැමිණිලිකරු විසින් තම ලිඛිත දේශන තුළින් දක්වා ඇති ආකාරයට ඔහු මෙම රැකියාවේ නියැලීමෙන් ලැබෙන්නාවූ වැටුපෙන් ජීවත් වන ඔහුගේ පවුලේ කලත්‍රයා සහ දරුවන් ද එකී වැටුප අහිමි වීමෙන් පීඩාවකට පත්ව ඇති ආකාරය දක්වා ඇති බැවිනි. දීර්ඝ කාලයක් පැමිණිලිකරු තම රැකියාව සුරක්ෂිත කර ගැනීමට දරණ ලද උත්සාහය ද එම තනතුර අහිමි කිරීමට වගඋත්තරකරුවන් දරා ඇති උත්සාහය ද අනුව පැමිණිලිකරු දිගින් දිගටම හිංසනයකට ලක්ව සිට ඇති බව ද නිරීක්ෂණය වේ. මෙම මානසික හිංසනය වසර 20ක පමණ සිට ඔහුට එරෙහිව සිදුව ඇති ක්‍රියාකාරකම් රැසක් අනුව සිදුව ඇති බව අනාවරණය වේ.

පැමිණිලිකරුගේ පත්වීම් වල නිත්‍යානුකූල භාවය සෙවීමට පත් කළ පෙර කී කමිටුව විසින් දෙන ලද අවසන් නිර්දේශය වන්නේ පැමිණිලිකරු සේවයෙන් ඉවත් කළ යුතු බවය. ඔහු විසින් 1997 වසරේදී ප්‍රථම වරට ලද පත්වීම ද පසුව ලද සියළු උසස්වීම් ද ආයතනයේ පත්වීම් බලධාරියා වන සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගන්නා ලද තීරණ අනුව සිදු කළ පත් කිරීම් ද කම්කරු විනිශ්චය සභාව ඉදිරියේ පැවති නඩු කටයුතු වලදී අවසන් නියෝග හෝ සමථයන් ප්‍රකාරව ලද සේවයට නැවත කළ පත්වීම් ද යන

සියල්ල මෙම කමිටුව විසින් ගන්නා ලද තීරණය මඟින් අවසන් කර ඇති බව නිරීක්ෂණය වේ. මෙම කමිටුව විසින් ගන්නා ලද තීරණය කුමන නෛතික පදනමක් මත ගන්නා ලද්දේ ද යන්න දක්වා නැති බව එකී කමිටු වාර්තාව නිරීක්ෂණය කිරීමේදී නිරීක්ෂණය වේ. ඒ අනුව මෙම තීරණ එම කමිටුව විසින් හා කමිටුව ඇතිකළ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ද වගඋත්තරකාර ආයතනයේ එම අවස්ථාවේ සේවය කළ සභාපති විසින් ද තම බලය අභිමතානුසාරීව භාවිතා කරමින් ගන්නා ලද තීරණයක් බව නිරීක්ෂණය වේ. මෙම කමිටුව ඉදිරියට පැමිණිලිකරු කැඳවා ඔහු එතෙක් දරමින් සිටි තනතුරු පැමිණිලිකරුට ලැබී ඇත්තේ කුමන ආකාරයට ද යන්න පැහැදිලි කර දීමට අවස්ථාවක් ලබා නොදී කමිටුව ඉදිරියේදී තෝරා ගන්නා ලද ලේඛන කිහිපයක් වෙත පමණක් අවධානය යොමු කර ගන්නා ලද තීරණයක් බව පැහැදිලි වේ.

තවද ඉහත කී කමිටුව විසින් නිර්දේශ කර ඇත්තේ 2020.03.31 දින සිට ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් විසින් ලබාදී තිබූ කිසිදු තනතුරක් දැරීමට පැමිණිලිකරුට නිත්‍යානුකූල හිමිකමක් නොමැති බවය. එහෙත් එකී තීරණයෙන් 2020.03.31 දිනට පෙර දින දරණ ලද තනතුරු සම්බන්ධව කිසිත් දක්වා නොමැති බව නිරීක්ෂණය වේ. මෙම කමිටුවේ නිර්දේශය භාවිතා කර 2022.12.09 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පැමිණිලිකරු සියළු පත්වීම් තුළින් ඉවත් කිරීමට තීරණය කර ඇති බව පමණක් වාර්තා කර තිබේ.

පැමිණිලිකරුගේ සේවය මින් පෙර අත්හිටුවා තිබූ අවස්ථාවක 2020.10.08 දින එවකට හිටපු සභාපති විසින් තම අංක : LMS/PF/1447 අනුව දක්වා ඇත්තේ පැමිණිලිකරු විසින් ඉදිරිපත් කළ අභියාචනයක් සලකා බලා 292 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී දෙන ලද තීරණය අනුව 2020.10.22 දින සිට නැවත සේවයට පත් කළ බවය. එහෙත් නැවත ඉන් පසු පැමිණි සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නැවත කමිටුවක් පිහිටුවා පැමිණිලිකරුගේ සේවය 2022.12.09 දින මේ ආකාරයට අවසන් කර ඇති බව නිරීක්ෂණය වන අතර ඉන් පැමිණිලිකරු දීර්ඝ කාලයක සිට සේවයට බැඳීම, වැඩ තහනම් කිරීම් වලට සහ නැවත සේවයේ පිහිටුවීම් වලට ලක් වෙමින් බරපතල ලෙස මූලික අයිතිවාසිකම් කඩ කිරීමකට ලක්ව තිබෙන බව නිරීක්ෂණය වී තිබේ.

එක් අවස්ථාවකදී පැමිණිලිකරුගේ සේවය තාවකාලිකව අත්හිටුවා තිබීම මත පැමිණිලිකරු විසින් සිදු කළ අභියානයක් සම්බන්ධව සලකා බැලීමට පත් කළ අධ්‍යක්ෂ මණ්ඩල සමාලෝචන කමිටුව වෙනුවෙන් පෙනී සිටි අධ්‍යක්ෂ, පී.බී.ඒ.සංජීව මහතා විසින් ඉදිරිපත් කළ නිර්දේශය තුළ වැදගත් කරුණු රැසක් අඩංගු බව නිරීක්ෂණය වේ. ඉන් දක්වා ඇත්තේ 2015 වසරේදී පැවති ජනාධිපතිවරණයේදී ජනාධිපති අපේක්ෂකයෙකු හට සහාය දක්වමින් දේශපාලනික කටයුතු වල යෙදීම මත වෙනත් ජනාධිපති අපේක්ෂකවරුන්ට සහාය දක්වන ලද වෘත්තීය සමිති රැසක් විසින් ඉදිරිපත් කළ පෙත්සමක් අනුව පුල්මුඩේ යන්ත්‍රාගාරයේ සිට පැමිණිලිකරු කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලයට ක්ෂණිකව ස්ථාන මාරු කර ඇති බව ය. පසුව පුල්මුඩේ ප්‍රදේශයේ ගම්වාසීන් ද සහභාගී කරවා ගනිමින් එකී පෙත්සම් ප්‍රධාන කාර්යාලයට යොමු කර ඒ අනුව 2015.04.22 දින චෝදනා පත්‍රයක් ලබා දී ඇති බව ද 2015.04.28 දින පැමිණිලිකරු විසින් ඊට අදාළව නිදහසට කරුණු ඉදිරිපත් කරමින් ස්වාධීන පරීක්ෂණ මණ්ඩලයක් පත් කරන ලෙස ඉල්ලා තිබී ඇත. එහෙත් එම අවස්ථාවේ එකී පෙත්සමට අනුව කරුණු සොයා බැලීමට පත් කළ ඒකපුද්ගල විනිශ්චයකාර එස්.කේ.ලියනගේ මහතා නම් යන අය දක්වා ඇත්තේ ඉදිරිපත් කර ඇති නිදහසට කරුණු ප්‍රමාණවත් නොවන බව ද චෝදනා සියල්ලටම පැමිණිලිකරු වැරදිකරුවකු බවද යන්න ය. ඒ පිළිබඳ පැමිණිලිකරු තම ලිඛිත දේශනයෙන් ප්‍රකාශ කර කියා සිටින්නේ එය ද්වේශ සහගතව සිදු කළ එකක් බවය. ඒ අනුව 2016.11.24 දින චෝදනා සියල්ලටම පැමිණිලිකරු වැරදිකරු බව දක්වා විනය නියෝගයක් පනවා තිබී ඇති අතර ඊට අමතරව 2017.09.15 දින ද ආයතනයේ වාහනයක්

අවභාවිතා කළ බවට දක්වා චෝදනා කරමින් ඒ පිළිබඳවද පරීක්ෂණයක් පැවැත්වීමට බී.එම්.කේ.මොහොට්ටාල යන අය පත් කර තිබී ඇති බව ලේඛන අනුව පෙනී යයි. ඔහු විසින් පවත්වන ලද පරීක්ෂණයකින් අනතුරුව පැමිණිලිකරු එම අවස්ථාවේ සේවයෙන් පහ කර තිබී ඇත. එලෙස පැමිණිලිකරු සේවයෙන් පහ කර තිබීම සම්බන්ධව දක්වා පැමිණිලිකරු විසින් ඉදිරිපත් කළ අභියාචනය සළකා බැලීමේ කටයුතු වෙනුවෙන් පසුව පත් කරන ලද කමිටුවේ අධ්‍යක්ෂ විසින් එක් අවස්ථාවක යොදන ලද සටහනක් පහත පරිදි උපුටා දක්වන්නේ ඉන් විශේෂ කාරණා කිහිපයක් ප්‍රකාශ වන බැවිනි. එනම්, " විනය පරීක්ෂණ වාර්තාව පුරාම හාස්‍ය උත්පාදක කරුණු රාශියක් අන්තර්ගත වන බව ද කිසිදු චෝදනාවක් සැකයකින් තොරව සනාථ කර නැති බව ද බොහේ නිගමනවලට එළඹ ඇත්තේ උපකල්පන හා සැකයන් මත බව ද උපකල්පන හා සැක මත නිගමන වලට එළඹීම යුක්තිය අපගමනය කරන බව" යන්න දක්වා තිබේ.

තවද පැමිණිලිකරු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන හා මානව සම්පත්) තනතුරට පත්ව ඇත්තේ බඳවා ගැනීමේ පටිපාටිය ප්‍රකාරව සුදුසුකම් නොමැතිව බව ඔහුට එරෙහිව පරීක්ෂණ පැවැත්වූ කමිටුව විසින් දක්වා ඇති එක් කාරණාවකි. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ පරීක්ෂණයේදී බඳවා ගැනීමේ පටිපාටිය වෙත අවධානය යොමු කරන ලද අතර එහිදී නිරීක්ෂණය වන්නේ පැමිණිලිකරු සුදුසුකම් ලබා තිබියදී ඒ සඳහා අයදුම් කිරීමෙන් අනතුරුව පත්වීම ලැබී ඇති බවය. එයට හේතුව වන්නේ මෙම තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන්ට සහ අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළව සළකා බලන ලද සුදුසුකම් දෙවර්ගයක් ඇති බවය. පැමිණිලිකරුට අදාළ වන්නේ අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ සුදුසුකම් වේ. ජ්‍යෙෂ්ඨ කළමණාකාර සේවා ගණය (HM-1-3) යටතේ ඇති මෙම තනතුරට අදාළ බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය වී ඇති අතර සංශෝධිත බඳවා ගැනීමේ පටිපාටිය ප්‍රකාරව අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා සුදුසුකම් කිහිපයක් යටතේ අයදුම් කළ හැකිය. ඒ අනුව කලමණාකාර (MM-1-1) සේවා ගණයේ තනතුරට අවම වශයෙන් වසර 07ක අදාළ විෂය ක්ෂේත්‍රයේ සතුටුදායක සේවා කාලයක් තිබීම ද ප්‍රමාණවත් බව දක්වා ඇත. පැමිණිලිකරු අභ්‍යන්තර අයදුම්කරුවෙකු ලෙස ඊට අදාළ සුදුසුකම් යටතේ ඉදිරිපත්ව අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර තිබියදී මෙම පරීක්ෂණ නිලධාරීන් තම වාර්තා තුළින් බාහිර අයදුම්කරුවන්ට අදාළ සුදුසුකම් පිළිබඳ දක්වමින් වැරදි අර්ථ නිරූපණයක් මත පිහිටා පැමිණිලිකරු බඳවා ගැනීමේ පටිපාටියට පරිබාහිරව බඳවා ගෙන ඇති බවට දැක්වීම සිදුව ඇති බව නිරීක්ෂණය වේ.

2020.11.10 දින සභාපති ලෙස කටයුතු කළ මුදිත විජේසිංහ මහතා විසින් තම අංක : LMS/PF/1447 මඟින් දක්වා ඇත්තේ පැමිණිලිකරු නැවත සේවයේ පිහිටුවීමට අදාළ කරුණු 292 වන සහ 295 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සාකච්ඡා කර ගන්නා ලද තීරණය ප්‍රකාරව පැමිණිලිකරු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන හා මානව සම්පත්) තනතුරේ වැඩ බැලීමට පත් කර ඇති බව ය. 2017.09.15 වන දිනට ලබමින් සිටි (HM-1) වැටුප් තලයේ ඔහු පිහිටුවන ලද බව ද දක්වා තිබේ. සංශෝධිත බඳවා ගැනීමේ පටිපාටියේ ඉහත තනතුරට අදාළව දක්වා ඇත්තේ (HM-1-1) වැටුප් බාණ්ඩයේ වසර දෙකක සතුටුදායක සේවා කාලයක් හා එම විෂය ක්ෂේත්‍රයට අදාළව තිබීම ප්‍රමාණවත් බවය. ඒ අනුව එම සුදුසුකම 2017.09.15 දින වනවිට ද පැමිණිලිකරු ලබා තිබෙන බව නිරීක්ෂණය වේ.

තවද පැමිණිලිකරුට එරෙහිව පරීක්ෂණ කටයුතු පවත්වන ලද කමිටුවලට පැමිණිලිකරු සම්බන්ධව සලකා බැලීමට ඉදිරිපත් කළ ලේඛන ලබාදීමේදී පැමිණිලිකරු පිළිබඳ වැරදි පූර්වාදර්ශයක් ඇති වන ආකාරයට කරුණු ඇතුළත් කරමින් එනම්, "සේවයෙන් පහ කර සිටි " "බඳවා ගැනීමේ පටිපාටිය ප්‍රකාරව සුදුසුකම් නොලද " "මින් පෙර විනය චෝදනාවන්ට ලක් වූ" ආදී වචන ඇතුළත් කරමින් අදාළ ලේඛන යොමු කර ඇති බව ද නිරීක්ෂණය වේ.

කම්කරු විනිශ්චය අධිකාරිය හමුවේ පැමිණිලිකරු පවරා තිබූ අංක : 01/අනි/11/2018 දරණ නඩුවේ කටයුතු අවසන් කර ඇත්තේ වගඋත්තරකාර සමාගම වෙනුවෙන් පෙනී සිටි නීතිඥ රංග දයානන්ද මහතාගේ කරුණු දැක්වීම අනුවය. එනම්, එම නඩුවේ කටයුතු අවසන් කිරීමට එකඟව ඔහු අධිකරණය ඉදිරියේ ප්‍රකාශ කර ඇත්තේ පැමිණිලිකරු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී(පරිපාලන හා මානව සම්පත්) තනතුරේ වැඩ බැලීමට පත් කර ඇති බැවින් මෙම නඩුව තවදුරටත් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවයක් නොවන බවත් ඒ අනුව සුදුසු නියෝගයක් නිකුත් කරන ලෙසත් දක්වමින්ය.

පළවන වගඋත්තරකාර කර්මාන්ත අමාත්‍යාංශයේ හිටපු ලේකම් විසින් එවකට කටයුතු කළ දෙවන වගඋත්තරකාර සමාගමේ සභාපති වන මුදිත විජේසිංහ මහතාට 2020.04.02 දින ලිඛිතව දන්වා ඇත්තේ, පැමිණිලිකරුගේ සේවය අත්හිටුවන ලෙසටත්, ඔහු සේවයේ පිහිටුවීම සම්බන්ධව නිදහසට කරුණු ඉදිරිපත් කරන ලෙසටත් ය. 2021.08.23 දින ඔහු විසින් කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් ලෙස කටයුතු කළ, දයා රත්නායක මහතා වෙත ලියා දක්වන්නේ, දේශපාලන පළිගැනීම් පිළිබඳව දක්වා පැමිණිලිකරු ඉදිරිපත් කළ අභියාචනය පිළිබඳ සළකා බැලීමට පත් කළ ත්‍රිපුද්ගල කමිටුවේ නිර්දේශ අනුව ද කම්කරු විනිශ්චයාධිකාරිය ඉදිරියේ වගඋත්තරකරුවන් විසින් තවදුරටත් පැමිණිලිකරු සේවයේ පිහිටුවීමට අදාළව කරුණු දක්වා තිබූ ආකාරය පිළිබඳව ද වාර්තා වී තිබූ ආකාරය අනුව 295 සහ 292 දරණ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අනුව ද පැමිණිලිකරු නැවත සේවයේ පිහිටුවන ලද බව ය. තවද ඒ වනවිට ඉදිරිපත්ව තිබූ අභ්‍යන්තර විගණන වාර්තාවක් ලෙස දක්වා තිබූ වාර්තාව දෝෂ සහගත සහ අධ්‍යක්ෂක මණ්ඩලය නොමග යවන සුළු වාර්තාවක් ලෙස සැලකියහැකි බව ද ඔහු පෙන්වා දී තිබේ. ඒ අනුව ඔහු වැඩිදුරටත් එකී ඔහුගේ වාර්තාවෙන් දක්වා ඇත්තේ, "The majoreity of the board of directors decided that the said internal audit report has many false statements and thus is a false and misleading report made with the intention of bringing disrepute to the government " ලෙසය.

2022.08.02 දින පැවති අංක 320 දරණ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඉස්මතුව තිබූ කරුණු දෙකක් වෙත අවධානය යොමු කරන ලද්දේ එකී කරුණු මෙම පැමිණිලිකරුගේ සිදුවීම් වලට අදාළව සළකා බැලියයුතු කරුණු කිහිපයක් පෙන්වා දෙන බැවිනි. එනම් අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කළ පී.බී.ඒ.සංජීව මහතා විසින් එකී මාණ්ඩලික රැස්වීමේදී විමසා සිටින ලද කාරණාවක් වන 2022.06.27 වන දින "පැමිණිලිකරු සහ ආරක්ෂක කලමණාකරු අතර කතා බහක් ඇතිවූ පමණින්ම වැඩ තහනම් කිරීමේ අවශ්‍යතාවයක් ඇති වූයේ ඇයිද" යන්න විමසා තිබීමය. ඒ අනුව පැමිණිලිකරුගේ වැඩ තහනම් කිරීමේ අවශ්‍යතාවයක් නොතිබූ අවස්ථාවක වැඩ තහනම් කිරීමක් සිදු කිරීම පිළිබඳව තීරණ ගෙන තිබීම අධ්‍යක්ෂ මණ්ඩල වලදී පවා සාකච්ඡාවට භාජනය වූ බව නිරීක්ෂණය වේ.

තවද මහා භාණ්ඩාගාරය නියෝජනය කළ අධ්‍යක්ෂකවරයෙකු ලෙස සිටි එස්.ඩබ්.මදනායක මහතා විසින් දක්වා ඇත්තේ, පැමිණිලිකරුගේ පත්වීම් වල නිත්‍යානුකූල භාවය පිළිබඳ ගැටළුවක් පෙන්නුම් කරන්නේ නම් අනුගමනය කළයුතු ඉදිරි ක්‍රියාමාර්ග නීතිපති දෙපාර්තමේන්තුව වෙතින් විමසා බලා සිදුකිරීම සුදුසු බව යන්න ද වඩාත් නිවැරදි ප්‍රකාශයක් බව සඳහන් කළ යුතුය.

ඉහත කී කරුණු අනුව පෙනී යන්නේ 2022.06.27 දින පැමිණිලිකරු හා ආරක්ෂක කලමණාකාරු අතර ගැටුම සමථකාරව විසඳීමට හැකියාව තිබියදී ඒ වෙත අවධානය යොමුව නැති බවය. තවද අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කළ එස්.ඩබ්.මදනායක මහතා ප්‍රකාශ කළ ආකාරයට පැමිණිලිකරුගේ පත්වීම් වල නිත්‍යානුකූලභාවය පිළිබඳ ගැටළුවක් පැන නැගී තිබුණේ නම් වඩාත් සුදුසු වන්නේ නීතිපති

වෙතින් විමසා බලා කටයුතු කළ යුතුව තිබූ බව මානව හිමිකම් කොමිෂන් සභාවේ දී පැවති මෙම පරීක්ෂණයේදී ද හොඳින් ගම්‍ය වූ කාරණාවක් බව පෙන්වා දියයුතුය.

ඉහත නිරීක්ෂණ වෙත අවධානය යොමු කිරීමේදී පෙනී යන්නේ වගඋත්තරකරුවන් විසින් දීර්ඝ කාලයක සිට පැමිණිලිකරුට එරෙහිව විවිධ අවස්ථාවලදී සිදු කරන ලද විවිධ පරීක්ෂණ හා කමිටු තුළින් ගන්නා ලද තීරණ අනුව පැමිණිලිකරුගේ රැකියාව අස්ථිර භාවයකට පත් කිරීමේ ප්‍රයත්නයක යෙදී සිටි බව ය. පැමිණිලිකරු තම සේවය අවසන් කර තිබූ අවස්ථා දෙකකදී කම්කරු විනිශ්චය අධිකාරිය වෙත ඉදිරිපත්ව කරුණු ඉදිරිපත් කර තිබීම අනුව රැකියාව නැවත ලැබී ඇති බව ද නිරීක්ෂණය වේ. එහෙත් එලෙස අධිකරණයන්හි දී ලද සහනයන් වෙත ද අවධානය යොමු කිරීමකින් තොරව 2022.06.28 දින වගඋත්තරකරුවන් විසින් ඇති කළ කමිටුව පැමිණිලිකරුගේ තනතුරු වල නිත්‍යානුකූල භාවය සෙවීමට පියවර ගෙන නැවත පැමිණිලිකරු සේවයෙන් පහ කර තිබේ.

පැමිණිලිකරුගේ සේවය අවසන් කිරීමට 2022.06.28 දින ඇති කළ කමිටුව විසින් කටයුතු කර ඇත්තේ දෙපාර්ශවයට සවන්දියයුතුය යන ප්‍රධාන මූලික නීති සිද්ධාන්ත පවා උල්ලංඝනය කරමින් බව නිරීක්ෂණය වේ. ඊට හේතුව වන්නේ පැමිණිලිකරු කිසිම දිනක එම කමිටුව ඉදිරියට කැඳවා කරුණු ප්‍රකාශ කිරීමට අවස්ථාවක් ලබා දී නැති බැවිනි. එම කමිටුව ඇති කිරීමේ අරමුණ වී ඇත්තේ 2020.03.31 දිනට පසු පැමිණිලිකරු ලද පත්වීම් වල නීත්‍යානුකූල භාවය සෙවීමට බව ප්‍රකාශ කර තිබුණද පැමිණිලිකරු ඉන් පෙර තනතුරු වලට පත්ව තිබූ අවස්ථා ද සියල්ල අවසන් කරමින් තීරණය ගෙන ඇති බව සනාථ වේ. ඉන් නිරීක්ෂණය වන්නේ වගඋත්තරකරුවන් විසින් ගන්නා ලද තීරණ ප්‍රකාරව අධිකරණය විසින් හා ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් හි සේවය කරන ලද මෙම වගඋත්තරකරුවන්ට පෙර කටයුතු කළ අධ්‍යක්ෂ මණ්ඩල විසින් දෙන ලද තීරණ ප්‍රකාරව පැමිණිලිකරුගේ එතෙක් දරමින් තිබූ සියළු තනතුරු අහිමි කර ඇති බවය.

එමෙන්ම එකී පරීක්ෂණ කමිටු වෙත පැමිණිලිකරු වරදකරු බවට හැඟී යන ආකාරයේ අදහසක් ලබාගත හැකි ලේඛන හා කමිටුවේ අවධානයට යොමු වියයුතු බවට තීරණය කරන ලද ලේඛන පමණක් ඉදිරිපත්කර කමිටුවේ සාමාජිකයින්ගේ අවධානය වෙනස් වන ආකාරයට වගඋත්තරකරුවන් කටයුතු කර ඇති ආකාරයක් ද පවතින බව නිරීක්ෂණය වේ. ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 13(5) ව්‍යවස්ථාව මඟින් සුරක්ෂිත කර ඇති "වරදකරු යයි ඔප්පු කරන තෙක් සෑම තැනැත්තෙකුම නිර්දෝෂීයයි පූර්වානුමාන කළයුත්තේය" යන පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම ද පැමිණිලිකරුට එරෙහිව වගඋත්තරකරුවන් කටයුතු කළ ආකාරය අනුව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12 (1) ව්‍යවස්ථාව මඟින් සුරක්ෂිත නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය යන පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම සහ 14(1)(උ) ව්‍යවස්ථාව මඟින් සුරක්ෂිත කර ඇති එකලාව හෝ අන් අය සමඟ යම් නීත්‍යානුකූල රැකියාවක, වෘත්තියක, කර්මාන්තයක, වෙළඳ ව්‍යාපාරයක හෝ ව්‍යවසායක නියුක්තවීමේ නිදහසට හිමිකම් ඇත්තේය යන පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම ද වගඋත්තරකාර පාර්ශවය විසින් උල්ලංඝනය කර ඇති බව ද මෙයින් නිගමනය කරනු ලැබේ.

ඒ අනුව පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කර සිටී.

1). පැමිණිලිකරු අවසන් වරට සේවය කරමින් සිටි සාමාන්‍යාධිකාරී(පාලන හා මානව සම්පත්) තනතුරේ කඩිනමින් නැවත සේවයේ පිහිටුවියයුතු අතර, සේවය අවසන් කළ දින සිට පැමිණිලිකරුට අහිමිව ගිය සේවා කාලය ලබාදීමට කටයුතු කළයුතු ය.

2). සේවය අවසන් කළ දින සිට පැමිණිලිකරුට ලැබියයුතුව තිබූ සියළු හිඟ වැටුප් හා දීමනා ද එකී තනතුරට අදාළව ලැබියයුතුව තිබූ වෙනත් අයිතිවාසිකම් ද හිමි කර දියයුතු ය.

3). ලංකා මිනිරල් සැන්ඩ්ස් පාලනාධිකාරියේ මෙම ක්‍රියා කලාපය පිළිබඳව කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් සුදුසු පරීක්ෂණයක් පවත්වා, අත්තනෝමතික ලෙස හා නීතියට පටහැනි ලෙස කටයුතු කර ඇත්නම් සභාපති, අධ්‍යක්ෂ මණ්ඩලය හා වෙනත් වගකිවයුතු නිලධාරීන් සම්බන්ධව සුදුසු පියවර ගතයුතු ය.

2026. 08. 04 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත නිර්දේශ කරනු ලැබේ.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දීමට කටයුතු කළයුතු අතර එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සළකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී.දෙහිදෙණිය,
සභාපති/හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී.පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත:- අමාත්‍යතුමා,
කර්මාන්ත අමාත්‍යාංශය,
73/1, ගාලු පාර,
කොළඹ 03.
- දැ.ගැ.ස.

දි/-R/A